# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல } 3/1/ පොදු(ප්‍රතිපත්ති)2017 } } 2017.10.12

චක්‍ර ලේඛ අංක. 2017/03

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

<u>රජයේ ඉඩම් ආඥා පනත යටතේ පිළියෙල කරන බදුකර හා දීමනා පත්‍ර සඳහා</u>
<u>කැඩැස්තර සිතියම් යොදා ගැනීම</u>

රජයේ ඉඩම් ආඥා පනත යටතේ දැනටමත් නිකුත් කරනු ලබන දීර්ඝකාලීන බදුකර, නිදහස් දීමනා පත්‍රයක් ලෙස පරිවර්තනය කිරීමේදී, බදුකර සඳහා නිකුත් කරන ලද L රේඛා චිත්‍රයක් තිබියදීත් නැවත වතාවක් අදාළ දීමනා පත්‍ර සඳහා O රේඛා චිත්‍ර ලබා ගැනීමට නැවත මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමක් සිදුවේ.

02. මේ තුලින් සිදුවන කාල ප්‍රමාදයන් හා ක්‍රියාවලියේ පවතින සංකීර්ණතා අවම කර ගැනීම සඳහා නැවත මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමකින් තොරව, පවතින L රේඛා චිත්‍රය O ලෙස සංශෝධනය සිදු කර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිදහස් දීමනා පත්‍රයන්හි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් එකඟතාවය පළ කර ඇත. එබැවින් මින් ඉදිරියේදී දීර්ඝකාලීන බදුකර, නිදහස් දීමනා පත්‍රයක් ලෙස පරිවර්තනය කිරීමේදී, නැවත මැනුම් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමකින් තොරව, බදුකර සඳහා නිකුත් කර ඇති L රේඛා චිත්‍රය O ලෙස සංශෝධනය සිදුකර දීමනා පත්‍රයන්හි ඉදිරි කටයුතු සිදු කිරීම අවශ්‍ය ඇති ආකෘති පත්‍රය මගින් මවිසින් සිදු කිරීමට කටයුතු කරන බැව් කාරුණිකව දන්වා සිටිමි.

(අත්සන)
ආර්.පී.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්-

1. ලේකම්/ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය- කාරු. දැ.ස.

2. සර්වේයර් ජනරාල්, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව - 2017.05.24 දින ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සහභාගීත්වයෙන් ඉඩම් අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව අනුව කාරු. දැ.ස.


දුරකථනය / தொலைபேசி / Telephone } 011-2797400
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2864051
වෙබ් ලිපිනය / இணையம் / Web Address } www.landcommdept.gov.lk
ඊමේල් / ஈ மெயில் / E-mail } landcom@landcommdept.gov.lk

මගේ අංකය- .......................................
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
මිහිකත මැදුර, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2017..............................

දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි,
....................................................

**"L" රේඛා චිත්‍ර "O" රේඛා චිත්‍ර ලෙස සංශෝධනය කිරීමේ ආකෘති පත්‍රය**

ග්‍රාම නිලධාරි වසම:............ ..........

ප්‍රා.ලේ.කොට්ඨාශය : ...............

"L" රේඛා චිත්‍රයට අදාළව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ යොමු අංකය හා දිනය: .............
.........................................

ගම :...............................

දිස්ත්‍රික්කය :................................

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ගොනු අංකය හා දිනය:...............
.........................................

කෝරළය :.........................

පළාත :........................................

පත්තුව :............................

| (1) බිම් කැබැල්ල | | ප්‍රමාණය | | | "L"රේඛා චිත්‍ර අංකය | දීමනා පත්‍රකරුගේ නම හා අංකය |
|---|---|---|---|---|---|---|
| පිඹුරු අංකය | කැබලි අංකය | අ. | රූ. | පර්. | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

අංක (1) යටතේ සවිස්තරව දක්වා ඇති ඉඩම් කැබැල්ල සඳහා ........................................................ නමින් දීමනා පත්‍රයක් ලබාදීම ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක........................................................හා ........................................................දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත. ඒ අනුව මෙම ඉඩම් කොටස සඳහා දීමනා පත්‍රයක් සකස් කිරීම පිණිස ඉඩමට අදාළව මින් පෙර නිකුත් කර ඇති අංක. ........................................................දරණ "L" රේඛා චිත්‍රය "O"රේඛා චිත්‍රය ලෙස සංශෝධනය කර ඇනීමට අවශ්‍ය "O" රේඛා චිත්‍රයේ අංකය මා වෙත ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර ඒ අනුව ඔබගේ ලේඛනද යාවත්කාලීන කර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

සහකාර ඉඩම් කොමසාරිස්
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

පිටපත් -1. මිනුම්පති - නරු. දැ.ස. හා අ.ක.ස.
2. ප්‍රාදේශීය ලේකම් -නරු.දැ.ස.